# සවියෙන් පෙරට අපි එකට

## e - ඉගෙනුම් කලාපය

## හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 6 | බුද්ධ ධර්මය | 3 | 18. ශාසනික දායාද සුරකිමු |

සැකසුම : ජේ. ඒ.ඩී.ඩී. භාග්‍යා ,
බප/ හො/ දේවරක්ෂිත මහා විද්‍යාලය,
මිල්ලනිය.

# ශාසනික දායාද සුරකිමු....

# 18 පාඩම

# බුද්ධ ධර්මය - 6 වසර



# උඳුවප් පුර පසළොස්වක පොහෝ දිනය වැදගත් වන කරුණු

- සංඝමිත්තා තෙරණියගේ වැඩමවීම නිසා මෙරට භික්ෂුණී ශාසනය ඇති වීම.
- ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවීම නිසා මෙරට සංස්කෘතික පරිවර්තනයක් ඇති වීම.

# සංඝමිත්තා තෙරණිය මෙරටට වැඩම වීමට හේතු වූයේ,

- මිහිඳු මහරහතන් වහන්සේගෙන් බණ ඇසූ අනුලා දේවිය ඇතුළු කාන්තාවන් පන්සියයක් දෙනා පැවිදි වීමට අවශ්‍ය බව මිහිඳු මහරහතන් වහන්සේට පැවසූ විට මිහිඳු හිමියන්ට ස්ත්‍රීන් පැවිදි කරවීමට නොහැකි බැවින් පැළලුප් නුවර වැඩවසන තම නැඟණිය වූ සංඝමිත්තා තෙරණියත්, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාවත් වැඩම කරවන ලෙස ධර්මාශෝක රජුට දැන්වීම නිසා.....

- සංඝමිත්තා තෙරණිය වැඩම වන විට මෙරට රජ කළේ,

  දේවානම්පියතිස්ස රජතුමා ය.

- සංඝමිත්තා තෙරණිය ඇතුළු පිරිස වැඩමවා ගෙන ඒමට දේවානම්පියතිස්ස රජු විසින් යවන ලද්දේ,

  තම බෑණා වූ අරිට්ඨ කුමරු ය.

- සංඝමිත්තා තෙරණිය ගොඩබට වරාය,

  දඹකොළ පටුන ය.

ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවීම ,

බෝධි ආගමනය

දුමින්දාගමනය

යන නම් වලින් ද හැඳින්වේ.

දුමිඳු ලෙස හැඳින්වෙන්නේ,

බෝධීන් වහන්සේ ය.

- ශ්‍රී ලංකාවේ පැවිද්දට පත් මුල්ම කාන්තාව වන්නේ ,

දේවානම්පියතිස්ස රජුගේ සහෝදර මහානාග යුවරජුගේ බිසව අනුලා දේවිය යි.

- ශ්‍රී මහා බෝධීන් වහන්සේ පාරිභෝගික චෛත්‍යයක් ලෙස වන්දනාවට පාත්‍ර වන්නේ,

බුදුරජාණන් වහන්සේට බුදු වීමට උපකාරී වීම නිසා ය.

⁂ මහින්දාගමනයට පෙර වෘක්ෂ වන්දනාවන්හි නිරත වූ ලාංකිකයන් බෝධිය වැඩම කරවීමත් සමඟ බෝධි වන්දනාවට හුරු විය. අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් හටගත් ඵල වලින් උපන් ශාඛා ලබා ගෙන ලංකාවේ විවිධ ප්‍රදේශවල රෝපණය කිරීමත් සමඟ බෝධි වන්දනය ප්‍රචලිත විය.

# බෝධි පූජා පැවැත්වීමේ අරමුණු ....

- රෝගාබාධ වලින් සුවය ලැබීම.
- අපල උවදුරු දුරු කර ගැනීම.
- විවිධ ගැටලු නිරාකරණය කර ගැනීම.
- විවිධ ජයග්‍රහණ ලබා ගැනීම

ආදිය....

# මහින්දාගමනය නිසා ලක්දිව වූ දියුණුව....

- බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට ධර්මාශෝක රජතුමා විසින් එවන ලද පිරිස දහ අට විවිධ ශිල්ප කලාවන්හි නිපුණතා ඇත්තන් වීම නිසා මෙරට කලා ශිල්ප වල විශාල දියුණුවක් ඇති විය.
- රටෙහි පවත්නා අහස් කුස සිපගන්නා ස්ථූප, ලොව මවිත කරවන මූර්ති හා කැටයම්, අලංකාර ගෘහ නිර්මාණ, නෙත් සිත් පැහැර ගන්නා වූ සිතුවම්, කලා රස වැහෙන සාහිත්‍ය නිර්මාණ, ලෝකයේ සෙසු ජාතීන්ගේ සම්භාවනාවට ලක්වන උතුම් සිරිත් විරිත් ආදී සෑම අංශයකම දියුණුවක් ඇති විය.

# ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනා කරමු.

සුපතිට්ඨිත රට්ඨානුරාධපුරේ
සමදිට්ඨිත දක්ඛිණ ශාඛා භවං
සුභමේඝවනම්බර මේඝ නිභං
ජයබෝධි මහං පනමාමි වරං

ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දකුණු ශාඛාව වූ, අනුරාධපුර මහමෙව්නා උයනෙහි පිහිටියා වූ, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ මම නමස්කාර කරමි.

# ක්‍රියාකාරකම....

1. ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ වැඩම කරවීම නිසා අපට ලැබුණු දායාද 02ක් ලියන්න.
2. බෝධි පූජාවක් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු වතාවත් 04ක් ලියන්න.
3. බෝධි පූජාවක් පැවැත්වීමට අවශ්‍ය පූජා භාණ්ඩ ලැයිස්තුවක් සකස් කරන්න.
4. දුමින්දාගමනය චිත්‍රයට නඟන්න.

# පිළිතුරු....

1. * දහ අට විධි කලා ශිල්ප දියුණු වීම.
   * බෝධි වන්දනාවට හුරු වීම.

2. * හොඳින් පිරිසිදු වී සුදුසු ඇඳුමින් බෝධි පූජාවට පැමිණීම.
   * බෝධි පූජාවට පෙර බෝ මළුව ඇමදීම.
   * පරමල් ඉවත් කර මල් ආසන පිරිසිදු කිරීම.
   * හොඳින් පෙරා ගත් පිරිසිදු ජලයෙන් බෝධීන් වහන්සේ නැහැවීම.

# පිළිතුරු....

3. මල් , පහන්, තෙල්, හඳුන්කූරු, පහන්තිර දැහැත්, ගිලන්පස

4. සංඝමිත්තා තෙරණිය වැඩම කරන ආකාරය කැමති ආකාරයකට චිත්‍රයට නගන්න.

# සැකසුම :



ජේ. ඒ. ඩී. ඩී. භාග්‍යා
බප/ හො/ ශ්‍රී දේවරක්ෂිත මහා විද්‍යාලය
මිල්ලනිය
077 - 8325742